# මහපොළ ශිෂ්‍යත්ව ප්‍රදානය - 2016/2017 ප්‍රවේශිත වර්ෂය

2016/2017 ප්‍රවේශිත වර්ෂයේ මහපොළ ශිෂ්‍යත්වලාභීන්ගේ ලියාපදිංචි කටයුතු කඩිනම් කිරීම සඳහා මෙවර පරිගණකය මඟින් (on line මඟින්) මහපොළ ආකෘති පත්‍රය www.mahapola.lk හරහා ලබාගෙන සම්පූර්ණ කලහැකි අතර, එම අයදුම්පත්‍රය එවීමේ අවසන් දිනය දීර්ඝ කොට ඇත. ඒ අනුව නැවත විශ්ව විද්‍යාල ආරම්භ කරන දිනය දක්වා එවිය හැකි අතර මෙම ආකෘති පත්‍රයේ මුද්‍රිත පිටපතක් විශ්ව විද්‍යාල නැවත ආරම්භ කල වහාම ශිෂ්‍යත්වලාභීන් වෙත ලබාදීමට කටයුතු යොදා ඇත. එම මුද්‍රිත ආකෘති පත්‍රය සම්පූර්ණ කර නැවත විශ්ව විද්‍යාල වෙත භාරදීම මඟින් ද මහපොළ ශිෂ්‍යත්ව සඳහා ලියාපදිංචි විය හැකිය.

කෙසේ වෙතත් මහපොළ ශිෂ්‍යත්වය සඳහා සුදුසුකම් ලබා ඇති සිසුන්ගේ නාම ලේඛණ විශ්ව විද්‍යාල වෙත යවා ඇති අතර එම සුදුසුකම් ලබා ඇති සියලුම සිසුන්හට මහපොළ වාරික මුදල් ලබාදෙන බව මහපොළ ශිෂ්‍යත්ව භාර අරමුදලේ අධ්‍යක්ෂවරයා අවධාරණය කොට සිටී. ඒ අනුව මහපොළ ශිෂ්‍යත්ව (on line) ආකෘති පත්‍රය එවීමට නොහැකිවීම තුලින් ශිෂ්‍යත්වය නොලැබේය යන්න පිළිබඳ අනිසි බියක් ඇති කර නොගත යුතු බව තවදුරටත් දන්වමි.

මේ සම්බන්ධයෙන් අවශ්‍ය තොරතුරු දුරකථන අංක 011-2685011 හා 071-9900014 මඟින්ද ලබාගත හැකිය.